// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2366/27 - 2024 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2024.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (ix) හා (xiii) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ පානීය ජල සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 (1) (අ) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම *ගැසට්* නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 22 වැනි දින,
ආණ්ඩුකාර කාර්යාලය,
මාළිගා චතුරස්‍රය,
මහනුවර දී ය.

1A - PG 6616 — 106 (2024/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ
අතුරු ව්‍යවස්ථාව

1. තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස පෞද්ගලික භාවිතය හා පොදු භාවිතය තුළ පානීය ජල සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිණිස ඊට අදාළ ජල මූලාශ්‍ර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතිවලට අදාළ ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු පානීය ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) හා 126 (XIII) යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ තුම්පනේ ප්‍රාදේශීය සභාවට බලතල පිරිනැමී ඇත.

3. මෙම අතුරු ව්‍යවස්ථාව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ පිහිටියාවූ මහජනතාවගේ පරිභෝජනය සඳහා පානීය ජලය සපයන සෑම ජල මූලාශ්‍රයකටම අදාළව පහත සඳහන් තොරතුරු පවත්වාගත යුතුය.

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම
iii. ග්‍රාම නිලධාරි වසම
iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
vii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල මූලාශ්‍රය භූගත ජල මූලාශ්‍රයක් වන විටදී ඉන් මීටර 15ක අරයකින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනීම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
iii. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.
iv. කැනීම් සිදු කිරීම
v. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ ඉදිකර ඇති කාණු පළුදු තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉඩ හැරීම.
vi. කවර හෝ දුරක සිට මූලාශ්‍රයට මතුපිට ජලය එකඑල්ලේ ගලා ඒමට සැළැස්වීම.
vii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විට දී ළිඳේ ගැට්ටේ සිට මීටර් 4.5ක අඩු දුරක සිට පොළොව මතුපිට ජලය ළිඳ තුළට කාන්දු වීමට ඉඩ හැරීම.
viii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, බිම් මට්ටමේ සිට මීටර් 3කට වඩා අඩු ගැඹුරකින් ළිඳට ජලය කාන්දු වන ආකාරයට පවත්වා ගැනීම.
ix. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ළිඳේ ආරක්ෂාව සඳහා සිමෙන්ති හා යකඩ යොදා වැර ගැන්වූ කොන්ක්‍රීට් හා ළිං ආවරණ යොදා ඇති අවස්ථාවක ඒ සඳහා භාවිත කර ඇති සිමෙන්ති ජලයට මුසුවන පරිදි හෝ යකඩ ආශ්‍රිතව ගොඩනැගෙන මළ බැඳීම් ජලයට මුසුවන පරිදි පවතින ආකාරයෙන් තිබීමට ඉඩ හැරීම.
x. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි බලය පවරන ලද අයෙකු විසින් නියම කරන කාල සීමාවන් තුළ ළිං ජලය සම්පූර්ණයෙන්ම හිස්කර ළිඳ මනා පවිත්‍රතාවයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම.

6. ස්වාභාවික මතුපිට ජල මූලාශ්‍රයක් වන විටදී තුළුමුවේ සිට දෙපසට හා ඉහළට මීටර 30කින් හා පහළට මීටර් 10කින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනීම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. වාහන සේදීම හෝ වෙනත් කවර හෝ යන්ත්‍රෝපකරණ සේදීම.
iii. ස්නානය සඳහා භාවිතය.
iv. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
v. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.
vi. කැනීම් සිදු කිරීම
vii. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම.
viii. වන වගාවක් නොවන වෙනත් කිසිදු වගා කාර්යයක් සඳහා යොදා ගැනීම.
ix. කවර හෝ තැනැත්තෙකු විසින් ජල මූලාශ්‍රයට කිසියම් අපද්‍රව්‍යයක් මිශ්‍ර විය හැකි පරිදි ජලය පිටතට ගැනීම සඳහා වන බාල්දියක් හෝ වෙනත් කවර හෝ මෙවලමක් භාවිතයට ගැනීම.

7. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් හා ගෘහස්ථ භාවිතයක් සඳහා වන ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හැර, ජල මූලාශ්‍රයක් භාවිතා කරමින් පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් හෝ ආයතනයක් විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ දෙවෙනි උපලේඛනයට සාරානුකූල වූ බලපත්‍රයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් ලබාගත යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව සාදන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලීම් කළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

10.1 ජලය බෙදාහැරීම ජල නළ පද්ධතියක් පමණක් භාවිතා කරමින් පරිභෝජනය සඳහා ජලය බෙදාහරින අවස්ථාවකදී

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.
(2) ඉල්ලුම්කරනු ලබන්නා ප්‍රජා මූල සංවිධානයක් වන විටදී ප්‍රාදේශීය සභාවේ හෝ ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.
(3) ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම ඉදිරිපත් කර තිබිය යුතුය.
(4) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක හා ඉදිකිරීම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.
(5) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරිත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.
(6) ජල ව්‍යාපෘතිය යටතේ සේවයේ යෙදවීමට අපේක්ෂිත සේවකයින් සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රය යටතේ ඉල්ලා සිටින තොරතුරු හා සේවකයින් වෙනස් වන සෑම අවස්ථාවකදීම ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරන බවට සහතික විය යුතුය.

10.2 ජලය බෙදාහැරීම බවුසරයක් හෝ ජල බහාලුමක් හෝ කවර හෝ මෙවලමක් භාවිතයට ගනිමින් ජලය එක්රැස්කර වාණිජ පරමාර්ථයන් වෙනුවෙන් ජලය බෙදාහැරීමක් සිදුකරන විටකදී,

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.
(2) මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පවත්වාගෙන යන ජල මූලාශ්‍රයක් යටතේ ලබාගනු ලබන ජලය බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.
(3) භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය සම්බන්ධයෙන් හා බෙදා හරින ජලය සම්බන්ධයෙන් 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුව අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට එම මණ්ඩලය වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) භාවිතය සඳහා ලබාදෙන ජලය, ජල සම්පත් මණ්ඩලය විසින් නිර්දේශිත කවර හෝ ක්‍රමවේදයක් යටතේ ජලය පිරිපහදු කර තිබීම.

(5) ජලය බෙදා හැරීම සඳහා යම් වාහනයක්, බහාලුමක් හෝ වෙනත් යම් මෙවලමක් භාවිතයට ගන්නේනම් එසේ යොදාගනු ලබන භාවිතය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීම් කරනු ලබන අවස්ථාවකදී එසේ ඉල්ලුම් පත්‍රය ලැබී මාසයක් ඇතුළත අපේක්ෂිත බලපත්‍රය ලබා දීම හෝ එසේ ලබාදිය නොහැකිනම් ඒ සඳහා වන හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසුව වලංගු වන්නේය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

i. බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

ii. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

iii. බලපත්‍රය ඉල්ලුම් කිරීමේ දී තහවුරු කරන ලද ජල මූලාශ්‍රය වෙතින් ලබා ගන්නා ලද ජලය බලපත්‍රයට අදාළ වන කාර්යයන් සඳහා යොදාගනු ලබන බවට තහවුරු වන පරිදි ක්‍රියා කළ යුතුය.

iv. ජලය බෙදාහැරීමේ දී ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා වෙනත් මෙවලම් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් නිකුත් කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුකූලව නිපදවා තිබිය යුතුය.

v. භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය හා බෙදා හරින ජලය 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.

vi. යොදාගනු ලබන සෑම සේවකයෙක්ම චර්මගත රෝගයකින් හෝ බෝවන රෝගයකින් පෙළෙන අයෙකු හෝ එවැනි අයෙකු ඇසුරු කළ අයෙකු නොවිය යුතුය.

vii. සේවයේ යොදවන සෑම අවස්ථාවකදීම සෞඛ්‍ය ආරක්ෂිත හා පිරිසිදු තත්වයේ ඇඳුම් ඇඳ සිටිය යුතු අතර, නියමිත පරිදි අත්වැසුම් පැළඳ සිටිය යුතුය.

viii. බල ප්‍රදේශය තුළ රෝග වැළැක්වීම හා නිරෝධායන ආඥාපනතට අනුකූලව නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවක දී එම නියෝගයන් යටතේ දක්වා ඇති කොන්දේසීන්ට අනුකූලව සේවාවන් පවත්වාගත යුතුය.

ix. ජල ව්‍යාපෘතියට අදාළව සේවයේ යොදවනු ලබන සෑම සේවකයෙකුම බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන තොරතුරු වලට නම් ඇතුළත් කරන ලද හෝ ඉන් පසු කවර හෝ අවස්ථාවක සේවයට යොදාගනු ලැබීනම් ඒ පිළිබඳ තොරතුරු ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරුවලට නම් ඇතුළත් කරන ලද අයෙකු විය යුතුය.

x. ජල ව්‍යාපෘතිය යටතේ සේවය කරනු ලබන සේවකයන් පිළිබඳව සෑම මාස හයකටම වරක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිර්දේශ කරන කාල සීමාවන් යටතේ සේවකයින් අදාළ සේවයේ යෙදවීම යථා යෝග්‍ය බවට තහවුරු කරන සහතිකයක් මගින් සනාථ කර තිබිය යුතුය.

14. බල ප්‍රදේශය තුළ වූ කිසියම් ජල මූලාශ්‍රයක් ජාතික ජල සම්පාදන මණ්ඩලය හැර මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයක් යටතේ භාවිතයට ගනු ලබන අවස්ථාවක දී එම බලපත්‍රය ලත් තැනැත්තා හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් එම ජල මූලාශ්‍රය භාවිතයට ගැනීමක් හෝ ඊට අයුතු ජල සම්බන්ධතාවයක් පවත්වා ගැනීම නොකළ යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ වන කවර හෝ ජල මූලාශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට අනුකූලව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සුදුසු හා සාධාරණයැයි සැළකිය හැකි වේලාවකදී සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය පවරන ලද කවර හෝ සභාවේ නිලධාරියෙකු ජල මූලාශ්‍රය පිහිටි පරිශ්‍රයට ඇතුල් වීම, සාම්පල් ලබා ගැනීම හෝ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි හැඟෙන වෙනත් තොරතුරක් ඉල්ලා සිටීම, පානීය ජලය බෙදාහරින යම් අවස්ථාවක එසේ බෙදාහරින ජලය සම්බන්ධයෙන් හෝ ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා මෙවලම් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකිරීම, ඒ සඳහා අවශ්‍යයැයි හැඟෙන තොරතුරක් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කාලය සභාපතිවරයා විසින් විශේෂයෙන් අවලංගු කරනු නොලැබුවේනම් නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට පටහැනිව යම් පානීය ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජලය බෙදා හැරීමේ දී ඒ පිළිබඳව හඳුනාගනු ලබන කවර අවස්ථාවක දී වුවද බලපත්‍රලාභියා වෙත අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා සභාපතිවරයා විසින් සාධාරණ කාලයක් ලබා දෙමින් ලිඛිත දැන්වීමක් භාරදිය යුතුය. එසේ ලබාදෙන සාධාරණ කාලය දින 14කට නොවැඩි විය යුතුය.

18. ඉහත වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව යටතේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීමට කිසියම් බලපත්‍රලාභියෙක් අපොහොසත්වන අවස්ථාවකදී සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරමින් ඒ බව බලපත්‍රය ලත් තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්ති යටතේ කුමක් සඳහන් කරනු ලැබුවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන බලපත්‍රයක් සඳහා අදාළ වන කිසියම් ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පළමු වරට බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන විටදී හා ලබාගත් බලපත්‍රයක් යටතේ වන ජල ව්‍යාපෘතියකට අදාළව වෙනස්කම් සහිතව නැවත බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයාට ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරනු ලබන කමිටුවකින් නිර්දේශ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් ඊට අදාළ බලපත්‍රය නිකුත් කිරීම නොකළ යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ 19 වන වගන්තියේ කාර්යය සඳහා හා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් පානීය ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත වන පරිදි කමිටුවක් විය යුතුය.

i. සභාපති
ii. ලේකම්
iii. තාක්ෂණික නිලධාරි
iv. පරිසර නිලධාරි
v. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ඔහු විසින් නම්කරන නිලධාරියෙකු

කෙසේ වුවද සේවයේ අවශ්‍යතාවය පරිදි කමිටුවේ පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා කමිටුවේ සහායට සභාවේ සභාපතිවරයා විසින් නම්කරනු ලබන වෙනත් කවර හෝ නිලධාරියෙකු කැඳවීමට ඉහත සඳහන් විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයකට යටත්ව, බලපත්‍රයකින් තොරව ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ දී හෝ 5 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දඩුවමකට යටත් විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වනවිට බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මකව පවතින මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පානීය ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසීන්ට අනුකූල වීම සඳහා කිසියම් ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙක්, ආයතනයක් හෝ සංවිධානයක් විසින් කිසියම් කාල සීමාවක් ඉල්ලා සිටින්නේනම් අතුරු ව්‍යවස්ථාවේ 20 වන වගන්තියේ සඳහන් කමිටුවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සභාපතිවරයා විසින් සහන කාලයක් ලබා දීම නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද මෙම වගන්තිය යටතේ ලබාදෙන සහන කාලය මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනෙන් පළමුවෙන් එළඹෙන ලිත් වර්ෂයක කාලය නොඉක්මවන කාලයක් නොවිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාව ද,

"සභාපතිවරයා" යන්නෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත අනුව තුම්පනේ ප්‍රාදේශීය සභාව සඳහා පත්වන සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ධුරය ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී සභාපතිවරයාගේ ධුරයේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා ලිඛිත නීතියට අනුකූලව පත්වන ලබන අයෙකුද,

"අපද්‍රව්‍ය" යන්නෙන් වරින් වර සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ අපද්‍රව්‍ය සඳහා ලබා දී ඇති අර්ථයමද,

"බලය පවරන ලද නිලධාරී" යන්නෙන් සභාපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද,

"ජල මූලාශ්‍රයක්" යන්නෙන් පානීය ජල අවශ්‍යතාවයක් වෙනුවෙන් පොළව මතුපිට ජලය හෝ භූගත ජලය භාවිතයට ගැනීම සඳහා හේතුවන ස්වාභාවික හෝ කෘතිමව සිදුවන ජලය ඒකරාශී වීමක් හෝ පොදු පානීය ජල පරිහරණයක් සඳහා විභවතාවයක් ඇති ස්ථානයක් ද,

*උපලේඛන අංක 1*

**පානීය ජලය ලබා ගැනීම සඳහා ජල මූලාශ්‍ර භාවිතය බලපත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ නම
2. ලිපිනය
3. ඉල්ලුම්කරු ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි අංකය /ඉල්ලුම්කරු සමිතියක් වන්නේ නම් අදාළ සමිතියේ ලියාපදිංචි අංකය

4. ජල මූලාශ්‍රය පිහිටි ස්ථානය පිළිබඳ පහත සඳහන් තොරතුරු
   i. ජල මූලාශ්‍රයේ නම
   ii. පිහිටීම (දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   iii. ජල මූලාශ්‍රයේ ස්වභාවය
   iv. ග්‍රාම නිලධාරී වසම
   v. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
   vi. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
   vii. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   viii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)
5. ජල ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලබන සේවකයන් පිළිබඳ තොරතුරු

| *අ/අ* | *නම* | *ලිපිනය* | *ජා.හැ.අ* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ව්‍යාපාරය සඳහා භාවිතා කරන වාහන සම්බන්ධ තොරතුරු

| *අ/අ* | *වාහන අංකය* | *වාහන වර්ගය* |
|---|---|---|
| | | |
| | | |

ඉහත අංක 05 සහ 06හි තොරතුරු වෙනස් වන සෑම අවස්ථාවකම සභාපතිවරයා දැනුවත් කළ යුතුය.

7. යෝජිත ජල ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව
8. දෛනිකව භාවිතා කිරීමට අපේක්ෂිත ජල ධාරිතාවය

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතුය.

i. සමිතියක් නම් ව්‍යවස්ථාවේ පිටපතක් සහ සමිතිය ලියාපදිංචි සහතිකයේ පිටපතක්
ii. ජල ව්‍යාපෘතියට අදාළ සංරචක උපයෝගී කර ගෙන ඇති ආකාරය පැහැදිළි වන පරිදි පිළිගත හැකි තාක්ෂණික නිලධාරියෙකු විසින් සහතික කරන ලද දළ සැලැස්ම
iii. ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම
iv. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරිත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති ලේඛන

අයදුම්කරුගේ අත්සන

දිනය

(මෙම අයදුම්පත්‍රය සමග අදාළ මාර්ගෝපදේශ ඇතුළත් ලේඛනයේ පිටපතක් ලබා දෙනු ලැබේ)

*උපලේඛන අංක 2*

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම -
2. ලිපිනය -
3. ජා.හැ.අ. -
4. අවසර ලබා දෙනු ලැබූ ජල මූලාශ්‍රය -
5. අවසර දෙනු ලැබූ කාලය -

......................................
සභාපති,
ප්‍රාදේශීය සභාව.

දිනයඃ

EOG 01 - 0093/1

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (ix) හා (xiii) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ පානීය ජල සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) (අ) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම *ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 28 වැනි දින,
ආණ්ඩුකාර කාර්යාලය,
මාළිගා චතුරස්‍රය,
මහනුවර දී ය.

**පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස පෞද්ගලික භාවිතය හා පොදු භාවිතය තුළ පානීය ජල සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිණිස ඊට අදාළ ජල මූලාශ්‍ර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතිවලට අදාළ ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු පානීය ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) හා 126 (XIII) යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ පූජාපිටිය ප්‍රාදේශීය සභාවට බලතල පිරිනැමී ඇත.

3. මෙම අතුරු ව්‍යවස්ථාව පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ පිහිටියා වූ මහජනතාවගේ පරිභෝජනය සඳහා පානීය ජලය සපයන සෑම ජල මූලාශ්‍රයකටම අදාළව පහත සඳහන් තොරතුරු පවත්වාගත යුතුය.

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම
iii. ග්‍රාම නිලධාරි වසම
iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
vii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල මූලාශ්‍රය භූගත ජල මූලාශ්‍රයක් වන විටදී ඉන් මීටර 15ක අරයකින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනීම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
iii. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.

iv. කැනීම් සිදු කිරීම.
v. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ ඉදිකර ඇති කාණු පළුදු තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉඩ හැරීම.
vi. කවර හෝ දුරක සිට මූලාශ්‍රයට මතුපිට ජලය එකළුල්ලේ ගලා ඒමට සැළැස්වීම.
vii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විට දී ළිඳේ ගැට්ටේ සිට මීටර් 4.5ක අඩු දුරක සිට පොළොව මතුපිට ජලය ළිඳ තුළට කාන්දු වීමට ඉඩ හැරීම.
viii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, බිම් මට්ටමේ සිට මීටර් 3කට වඩා අඩු ගැඹුරකින් ළිඳට ජලය කාන්දු වන ආකාරයට පවත්වා ගැනීම.
ix. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ළිඳේ ආරක්ෂාව සඳහා සිමෙන්ති හා යකඩ යොදා වැර ගැන්වූ කොන්ක්‍රීට් හා ළිං ආවරණ යොදා ඇති අවස්ථාවක ඒ සඳහා භාවිතා කර ඇති සිමෙන්ති ජලයට මුසුවන පරිදි හෝ යකඩ ආශ්‍රිතව ගොඩනැගෙන මළ බැඳීම් ජලයට මුසුවන පරිදි පවතින ආකාරයෙන් තිබීමට ඉඩ හැරීම.
x. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි බලය පවරන ලද අයෙකු විසින් නියම කරන කාල සීමාවන් තුළ ළිං ජලය සම්පූර්ණයෙන්ම හිස්කර ළිඳ මනා පවිත්‍රතාවයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම.

6. ස්වාභාවික මතුපිට ජල මූලාශ්‍රයක් වන විටදී තුළුමුවේ සිට දෙපසට හා ඉහළට මීටර 30කින් හා පහළට මීටර් 10කින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනීම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. වාහන සේදීම හෝ වෙනත් කවර හෝ යන්ත්‍රෝපකරණ සේදීම.
iii. ස්නානය සඳහා භාවිතය.
iv. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
v. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.
vi. කැනීම් සිදු කිරීම.
vii. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම.
viii. වන වගාවක් නොවන වෙනත් කිසිදු වගා කාර්යයක් සඳහා යොදා ගැනීම.
ix. කවර හෝ තැනැත්තෙකු විසින් ජල මූලාශ්‍රයට කිසියම් අපද්‍රව්‍යයක් මිශ්‍ර විය හැකි පරිදි ජලය පිටතට ගැනීම සඳහා වන බාල්දියක් හෝ වෙනත් කවර හෝ මෙවලමක් භාවිතයට ගැනීම.

7. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් හා ගෘහස්ථ භාවිතයක් සඳහා වන ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හැර, ජල මූලාශ්‍රයක් භාවිතා කරමින් පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් හෝ ආයතනයක් විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ දෙවෙනි උපලේඛනයට සාරානුකූල වූ බලපත්‍රයක් පූජපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් ලබාගත යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව සාදන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලීම් කළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

10. 1 ජලය බෙදාහැරීම ජල නළ පද්ධතියක් පමණක් භාවිතා කරමින් පරිභෝජනය සඳහා ජලය බෙදාහරින අවස්ථාවකදී,

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) ඉල්ලුම්කරනු ලබන්නා ප්‍රජා මූල සංවිධානයක් වන විටදී ප්‍රාදේශීය සභාවේ හෝ ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක හා ඉදිකිරීම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

(5) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරිත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(6) ජල ව්‍යාපෘතිය යටතේ සේවයේ යෙදවීමට අපේක්ෂිත සේවකයින් සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රය යටතේ ඉල්ලා සිටින තොරතුරු හා සේවකයින් වෙනස් වන සෑම අවස්ථාවකදීම ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරන බවට සහතික විය යුතුය.

10.2 ජලය බෙදාහැරීම බවුසරයක් හෝ ජල බහාලුමක් හෝ කවර හෝ මෙවලමක් භාවිතයට ගනිමින් ජලය එක්රැස්කර වාණිජ පරමාර්ථයන් වෙනුවෙන් ජලය බෙදාහැරීමක් සිදුකරන විටකදී,

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පවත්වාගෙන යන ජල මූලාශ්‍රයක් යටතේ ලබාගනු ලබන ජලය බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(3) භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය සම්බන්ධයෙන් හා බෙදා හරින ජලය සම්බන්ධයෙන් 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුව අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට එම මණ්ඩලය වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) භාවිතය සඳහා ලබාදෙන ජලය, ජල සම්පත් මණ්ඩලය විසින් නිර්දේශිත කවර හෝ ක්‍රමවේදයක් යටතේ ජලය පිරිපහදු කර තිබීම.

(5) ජලය බෙදා හැරීම සඳහා යම් වාහනයක්, බහාලුමක් හෝ වෙනත් යම් මෙවලමක් භාවිතයට ගන්නේනම් එසේ යොදාගනු ලබන භාවිතය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීම් කරනු ලබන අවස්ථාවකදී එසේ ඉල්ලුම් පත්‍රය ලැබී මාසයක් ඇතුළත අපේක්ෂිත බලපත්‍රය ලබා දීම හෝ එසේ ලබාදිය නොහැකිනම් ඒ සඳහා වන හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසුව වලංගු වන්නේය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

i. බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

ii. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

iii. බලපත්‍රය ඉල්ලුම් කිරීමේ දී තහවුරු කරන ලද ජල මූලාශ්‍රය වෙතින් ලබා ගන්නා ලද ජලය බලපත්‍රයට අදාළ වන කාර්යයන් සඳහා යොදාගනු ලබන බවට තහවුරු වන පරිදි ක්‍රියා කළ යුතුය.

iv. ජලය බෙදාහැරීමේ දී ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා වෙනත් මෙවලම් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් නිකුත් කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුකූලව නිපදවා තිබිය යුතුය.

v. භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය හා බෙදා හරින ජලය 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.

vi. යොදාගනු ලබන සෑම සේවකයෙක්ම චර්මගත රෝගයකින් හෝ බෝවන රෝගයකින් පෙළෙන අයෙකු හෝ එවැනි අයෙකු ඇසුරු කළ අයෙකු නොවිය යුතුය.

vii. සේවයේ යොදවන සෑම අවස්ථාවකදීම සෞඛ්‍ය ආරක්ෂිත හා පිරිසිදු තත්ත්වයේ ඇඳුම් ඇඳ සිටිය යුතු අතර, නියමිත පරිදි අත්වැසුම් පැළඳ සිටිය යුතුය.

viii. බල ප්‍රදේශය තුළ රෝග වැළැක්වීම හා නිරෝධායන ආඥාපනතට අනුකූලව නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවක දී එම නියෝගයන් යටතේ දක්වා ඇති කොන්දේසීන්ට අනුකූලව සේවාවන් පවත්වාගත යුතුය.

ix. ජල ව්‍යාපෘතියට අදාළව සේවයේ යොදවනු ලබන සෑම සේවකයෙකුම බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන තොරතුරු වලට නම් ඇතුළත් කරන ලද හෝ ඉන් පසු කවර හෝ අවස්ථාවක සේවයට යොදාගනු ලැබීනම් ඒ පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරුවලට නම් ඇතුළත් කරන ලද අයෙකු විය යුතුය.

x. ජල ව්‍යාපෘතිය යටතේ සේවය කරනු ලබන සේවකයන් පිළිබඳව සෑම මාස හයකටම වරක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිර්දේශ කරන කාල සීමාවන් යටතේ සේවකයින් අදාළ සේවයේ යෙදවීම යථා යෝග්‍ය බවට තහවුරු කරන සහතිකයක් මගින් සනාථ කර තිබිය යුතුය.

14. බල ප්‍රදේශය තුළ වූ කිසියම් ජල මූලාශ්‍රයක් ජාතික ජල සම්පාදන මණ්ඩලය හැර මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයක් යටතේ භාවිතයට ගනු ලබන අවස්ථාවක දී එම බලපත්‍රය ලත් තැනැත්තා හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් එම ජල මූලාශ්‍රය භාවිතයට ගැනීමක් හෝ ඊට අයුතු ජල සම්බන්ධතාවයක් පවත්වා ගැනීම නොකළ යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ වන කවර හෝ ජල මූලාශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට අනුකූලව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සුදුසු හා සාධාරණයැයි සැළකිය හැකි වේලාවකදී සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය පවරන ලද කවර හෝ සභාවේ නිලධාරියෙකු ජල මූලාශ්‍රය පිහිටි පරිශ්‍රයට ඇතුල් වීම, සාම්පල් ලබා ගැනීම හෝ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි හැඟෙන වෙනත් තොරතුරක් ඉල්ලා සිටීම, පානීය ජලය බෙදාහරින යම් අවස්ථාවක එසේ බෙදාහරින ජලය සම්බන්ධයෙන් හෝ ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා මෙවලම් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකිරීම, ඒ සඳහා අවශ්‍යයැයි හැඟෙන තොරතුරක් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කාලය සභාපතිවරයා විසින් විශේෂයෙන් අවලංගු කරනු නොලැබුවේනම් නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට පටහැනිව යම් පානීය ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජලය බෙදා හැරීමේ දී ඒ පිළිබඳව හඳුනාගනු ලබන කවර අවස්ථාවක දී වුවද බලපත්‍රලාභියා වෙත අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා සභාපතිවරයා විසින් සාධාරණ කාලයක් ලබා දෙමින් ලිඛිත දැන්වීමක් භාරදිය යුතුය. එසේ ලබාදෙන සාධාරණ කාලය දින 14කට නොවැඩි විය යුතුය.

18. ඉහත වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව යටතේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීමට කිසියම් බලපත්‍රලාභියෙක් අපොහොසත්වන අවස්ථාවකදී සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරමින් ඒ බව බලපත්‍රය ලත් තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්ති යටතේ කුමක් සඳහන් කරනු ලැබුවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන බලපත්‍රයක් සඳහා අදාළ වන කිසියම් ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පළමු වරට බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන විටදී හා ලබාගත් බලපත්‍රයක් යටතේ වන ජල ව්‍යාපෘතියකට අදාළව වෙනස්කම් සහිතව නැවත බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයාට ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරනු ලබන කමිටුවකින් නිර්දේශ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් ඊට අදාළ බලපත්‍රය නිකුත් කිරීම නොකළ යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ 19 වගන්තියේ කාර්යය සඳහා හා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් පානීය ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත වන පරිදි කමිටුවක් විය යුතුය.

i. සභාපති
ii. ලේකම්
iii. තාක්ෂණික නිලධාරි
iv. පරිසර නිලධාරි
v. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ඔහු විසින් නම්කරන නිලධාරියෙකු

කෙසේ වුවද සේවයේ අවශ්‍යතාවය පරිදි කමිටුවේ පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා කමිටුවේ සහායට සභාවේ සභාපතිවරයා විසින් නම්කරනු ලබන වෙනත් කවර හෝ නිලධාරියෙකු කැඳවීමට ඉහත සඳහන් විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයකට යටත්ව, බලපත්‍රයකින් තොරව ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ දී හෝ 5 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දඬුවමකට යටත් විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වනවිට බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මකව පවතින මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පානීය ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසීන්ට අනුකූල වීම සඳහා කිසියම් ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙක්, ආයතනයක් හෝ සංවිධානයක් විසින් කිසියම් කාල සීමාවක් ඉල්ලා සිටින්නේනම් 20 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සභාපතිවරයා විසින් සහන කාලයක් ලබා දීම නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද මෙම වගන්තිය යටතේ ලබාදෙන සහන කාලය මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනෙන් පළමුවෙන් එළඹෙන ලිත් වර්ෂයක කාලය නොඉක්මවන කාලයක් නොවිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් පූජාපිටිය ප්‍රාදේශීය සභාව ද,
"සභාපතිවරයා" යන්නෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත අනුව පූජාපිටිය ප්‍රාදේශීය සභාව සඳහා පත්වන සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ධුරය ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී සභාපතිවරයාගේ ධුරයේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා ලිඛිත නීතියට අනුකූලව පත්වන ලබන අයෙකුද,
"අපද්‍රව්‍ය" යන්නෙන් වරින් වර සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ අපද්‍රව්‍ය සඳහා ලබා දී ඇති අර්ථයමද,
"බලය පවරන ලද නිලධාරි" යන්නෙන් සභාපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද,
"ජලමූලාශ්‍රයක්" යන්නෙන් පානීය ජල අවශ්‍යතාවයක් වෙනුවෙන් පොළව මතුපිට ජලය හෝ භූගත ජලය භාවිතයට ගැනීම සඳහා හේතුවන ස්වාභාවික හෝ කෘත්‍රිමව සිදුවන ජලය ඒකරාශී වීමක් හෝ පොදු පානීය ජල පරිහරණයක් සඳහා විභවතාවයක් ඇති ස්ථානයක් ද,

*උපලේඛන අංක 1*

**පානීය ජලය ලබා ගැනීම සඳහා ජලමූලාශ්‍ර භාවිතය බලපත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රය**

1. ඉල්ලුම් කරුගේ නම
2. ලිපිනය
3. ඉල්ලුම්කරු ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි අංකය /ඉල්ලුම්කරු සමිතියක් වන්නේ නම් අදාළ සමිතියේ ලියාපදිංචි අංකය

4. ජල මූලාශ්‍රය පිහිටි ස්ථානය පිළිබඳ පහත සඳහන් තොරතුරු
   i. ජල මූලාශ්‍රයේ නම
   ii. පිහිටීම (දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   iii. ජල මූලාශ්‍රයේ ස්වභාවය
   iv. ග්‍රාම නිලධාරි වසම
   v. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
   vi. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
   vii. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   viii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)
5. ජල ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලබන සේවකයන් පිළිබඳ තොරතුරු

| *අ/අ* | *නම* | *ලිපිනය* | *ජා.හැ.අ.* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ව්‍යාපාරය සඳහා භාවිතා කරන වාහන සම්බන්ධ තොරතුරු

| *අ/අ* | *වාහන අංකය* | *වාහන වර්ගය* |
|---|---|---|
| | | |
| | | |

ඉහත අංක 05 සහ 06හි තොරතුරු වෙනස් වන සෑම අවස්ථාවකම සභාපතිවරයා දැනුවත් කළ යුතුය.

7. යෝජිත ජල ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව
8. දෛනිකව භාවිතා කිරීමට අපේක්ෂිත ජල ධාරිතාවය

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතුය.

i. සමිතියක් නම් ව්‍යවස්ථාවේ පිටපතක් සහ සමිතිය ලියාපදිංචි සහතිකයේ පිටපතක්
ii. ජල ව්‍යාපෘතියට අදාළ සංරචක උපයෝගී කර ගෙන ඇති ආකාරය පැහැදිළි වන පරිදි පිළිගත හැකි තාක්ෂණික නිලධාරියෙකු විසින් සහතික කරන ලද දල සැලැස්ම
iii. ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම
iv. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමීත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරීත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති ලේඛන.

අයදුම්කරුගේ අත්සන

දිනය:

(මෙම අයදුම්පත්‍රය සමග අදාළ මාර්ගෝපදේශ ඇතුළත් ලේඛනයේ පිටපතක් ලබා දෙනු ලැබේ)

*උපලේඛන අංක 2*

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම -
2. ලිපිනය -
3. ජා.හැ.අ. -
4. අවසර ලබා දෙනු ලැබූ ජල මූලාශ්‍රය -
5. අවසර දෙනු ලැබූ කාලය -

......................................
සභාපති,
ප්‍රාදේශීය සභාව.

දිනය:

EOG 01 - 0093/2

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (ix) හා (xiii) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ පානීය ජල සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 (1) (අ) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම *ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 22 වැනි දින,
ආණ්ඩුකාර කාර්යාලය,
මාළිගා චතුරස්‍රය,
මහනුවර දී ය.

**පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස පෞද්ගලික භාවිතය හා පොදු භාවිතය තුළ පානීය ජල සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිණිස ඊට අදාළ ජල මූලාශ්‍ර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතිවලට අදාළ ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු පානීය ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) හා 126 (XIII) යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ පල්ලේපොල ප්‍රාදේශීය සභාවට බලතල පිරිනැමී ඇත.

3. මෙම අතුරු ව්‍යවස්ථාව පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ පිහිටියාවූ මහජනතාවගේ පරිභෝජනය සඳහා පානීය ජලය සපයන සෑම ජල මූලාශ්‍රයකටම අදාළව පහත සඳහන් තොරතුරු පවත්වාගත යුතුය.

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම
iii. ග්‍රාම නිලධාරි වසම
iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
vii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල මූලාශ්‍රය භූගත ජල මූලාශ්‍රයක් වන විටදී ඉන් මීටර 15ක අරයකින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනිම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
iii. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.

iv. කැනීම් සිදු කිරීම
v. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ ඉදිකර ඇති කාණු පළුදු තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉඩ හැරීම.
vi. කවර හෝ දුරක සිට මූලාශ්‍රයට මතුපිට ජලය එක එල්ලේ ගලා ඒමට සැළැස්වීම.
vii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විට දී ළිඳේ ගැට්ටේ සිට මීටර් 4.5ක අඩු දුරක සිට පොළොව මතුපිට ජලය ළිඳ තුළට කාන්දු වීමට ඉඩ හැරීම.
viii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, බිම් මට්ටමේ සිට මීටර් 3කට වඩා අඩු ගැඹුරකින් ළිඳට ජලය කාන්දු වන ආකාරයට පවත්වා ගැනීම.
ix. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ළිඳේ ආරක්ෂාව සඳහා සිමෙන්ති හා යකඩ යොදා වැර ගැන්වූ කොන්ක්‍රීට් හා ළිං ආවරණ යොදා ඇති අවස්ථාවක ඒ සඳහා භාවිතා කර ඇති සිමෙන්ති ජලයට මුසුවන පරිදි හෝ යකඩ ආශ්‍රිතව ගොඩනැගෙන මළ බැඳීම් ජලයට මුසුවන පරිදි පවතින ආකාරයෙන් තිබීමට ඉඩ හැරීම.
x. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි බලය පවරන ලද අයෙකු විසින් නියම කරන කාල සීමාවන් තුළ ළිං ජලය සම්පූර්ණයෙන්ම හිස්කර ළිඳ මනා පවිත්‍රතාවයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම.

6. ස්වාභාවික මතුපිට ජල මූලාශ්‍රයක් වන විටදී තුළුමුවේ සිට දෙපසට හා ඉහළට මීටර 30කින් හා පහළට මීටර් 10කින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනීම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. වාහන සේදීම හෝ වෙනත් කවර හෝ යන්ත්‍රෝපකරණ සේදීම.
iii. ස්නානය සඳහා භාවිතය.
iv. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
v. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.
vi. කැනීම් සිදු කිරීම
vii. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම.
viii. වන වගාවක් නොවන වෙනත් කිසිදු වගා කාර්යයක් සඳහා යොදා ගැනීම.
ix. කවර හෝ තැනැත්තෙකු විසින් ජල මූලාශ්‍රයට කිසියම් අපද්‍රව්‍යයක් මිශ්‍ර විය හැකි පරිදි ජලය පිටතට ගැනීම සඳහා වන බාල්දියක් හෝ වෙනත් කවර හෝ මෙවලමක් භාවිතයට ගැනීම.

7. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් හා ගෘහස්ථ භාවිතයක් සඳහා වන ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හැර, ජල මූලාශ්‍රයක් භාවිතා කරමින් පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් හෝ ආයතනයක් විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ දෙවෙනි උපලේඛනයට සාරානුකූල වූ බලපත්‍රයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් ලබාගත යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව සාදන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලීම් කළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

10. 1 ජලය බෙදාහැරීම ජල නළ පද්ධතියක් පමණක් භාවිතා කරමින් පරිභෝජනය සඳහා ජලය බෙදාහරින අවස්ථාවකදී

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) ඉල්ලුම්කරනු ලබන්නා ප්‍රජා මූල සංවිධානයක් වන විටදී ප්‍රාදේශීය සභාවේ හෝ ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක හා ඉදිකිරීම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

(5) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරිත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(6) ජල ව්‍යාපෘතිය යටතේ සේවයේ යෙදවීමට අපේක්ෂිත සේවකයින් සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රය යටතේ ඉල්ලා සිටින තොරතුරු හා සේවකයින් වෙනස් වන සෑම අවස්ථාවකදීම ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරන බවට සහතික විය යුතුය.

10. 2 ජලය බෙදාහැරීම් බවුසරයක් හෝ ජල බහාලුමක් හෝ කවර හෝ මෙවලමක් භාවිතයට ගනිමින් ජලය එක්රැස්කර වාණිජ පරමාර්ථයන් වෙනුවෙන් ජලය බෙදාහැරීමක් සිදුකරන විටකදී,

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පවත්වාගෙන යන ජල මූලාශ්‍රයක් යටතේ ලබාගනු ලබන ජලය බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(3) භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය සම්බන්ධයෙන් හා බෙදා හරින ජලය සම්බන්ධයෙන් 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුව අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට එම මණ්ඩලය වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) භාවිතය සඳහා ලබාදෙන ජලය, ජල සම්පත් මණ්ඩලය විසින් නිර්දේශිත කවර හෝ ක්‍රමවේදයක් යටතේ ජලය පිරිපහදු කර තිබීම.

(5) ජලය බෙදා හැරීම සඳහා යම් වාහනයක්, බහාලුමක් හෝ වෙනත් යම් මෙවලමක් භාවිතයට ගන්නේනම් එසේ යොදාගනු ලබන භාවිතය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීම් කරනු ලබන අවස්ථාවකදී එසේ ඉල්ලුම් පත්‍රය ලැබී මාසයක් ඇතුළත අපේක්ෂිත බලපත්‍රය ලබා දීම හෝ එසේ ලබාදිය නොහැකිනම් ඒ සඳහා වන හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් *තීරණය* කර *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසුව වලංගු වන්නේය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

i. බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

ii. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

iii. බලපත්‍රය ඉල්ලුම් කිරීමේ දී තහවුරු කරන ලද ජල මූලාශ්‍රය වෙතින් ලබා ගන්නා ලද ජලය බලපත්‍රයට අදාළ වන කාර්යයන් සඳහා යොදාගනු ලබන බවට තහවුරු වන පරිදි ක්‍රියා කළ යුතුය.

iv. ජලය බෙදාහැරීමේ දී ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා වෙනත් මෙවලම් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් නිකුත් කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුකූලව නිපදවා තිබිය යුතුය.

v. භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය හා බෙදා හරින ජලය 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.

vi. යොදාගනු ලබන සෑම සේවකයෙක්ම චර්මගත රෝගයකින් හෝ බෝවන රෝගයකින් පෙළෙන අයෙකු හෝ එවැනි අයෙකු ඇසුරු කළ අයෙකු නොවිය යුතුය.

vii. සේවයේ යොදවන සෑම අවස්ථාවකදීම සෞඛ්‍ය ආරක්ෂිත හා පිරිසිදු තත්වයේ ඇඳුම් ඇඳ සිටිය යුතු අතර, නියමිත පරිදි අත්වැසුම් පැළඳ සිටිය යුතුය.

viii. බල ප්‍රදේශය තුළ රෝග වැළැක්වීම හා නිරෝධායන ආඥා පනතට අනුකූලව නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවක දී එම නියෝගයන් යටතේ දක්වා ඇති කොන්දේසීන්ට අනුකූලව සේවාවන් පවත්වාගත යුතුය.

ix. ජල ව්‍යාපෘතියට අදාළව සේවයේ යොදවනු ලබන සෑම සේවකයෙකුම බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන තොරතුරු වලට නම් ඇතුළත් කරන ලද හෝ ඉන් පසු කවර හෝ අවස්ථාවක සේවයට යොදාගනු ලැබීනම් ඒ පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරුවලට නම් ඇතුළත් කරන ලද අයෙකු විය යුතුය.

x. ජල ව්‍යාපෘතිය යටතේ සේවය කරනු ලබන සේවකයන් පිළිබඳව සෑම මාස හයකටම වරක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිර්දේශ කරන කාල සීමාවන් යටතේ සේවකයින් අදාළ සේවයේ යෙදවීම යථා යෝග්‍ය බවට තහවුරු කරන සහතිකයක් මගින් සනාථ කර තිබිය යුතුය.

14. බල ප්‍රදේශය තුළ වූ කිසියම් ජල මූලාශ්‍රයක් ජාතික ජල සම්පාදන මණ්ඩලය හැර මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයක් යටතේ භාවිතයට ගනු ලබන අවස්ථාවක දී එම බලපත්‍රය ලත් තැනැත්තා හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් එම ජල මූලාශ්‍රය භාවිතයට ගැනීමක් හෝ ඊට අයුතු ජල සම්බන්ධතාවයක් පවත්වා ගැනීම නොකළ යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ වන කවර හෝ ජල මූලාශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට අනුකූලව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සුදුසු හා සාධාරණයැයි සැළකිය හැකි වේලාවකදී සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය පවරන ලද කවර හෝ සභාවේ නිලධාරියෙකු ජල මූලාශ්‍රය පිහිටි පරිශ්‍රයට ඇතුල් වීම, සාම්පල් ලබා ගැනීම හෝ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි හැඟෙන වෙනත් තොරතුරක් ඉල්ලා සිටීම, පානීය ජලය බෙදාහරින යම් අවස්ථාවක එසේ බෙදාහරින ජලය සම්බන්ධයෙන් හෝ ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා මෙවලම් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකිරීම, ඒ සඳහා අවශ්‍යයැයි හැඟෙන තොරතුරක් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කාලය සභාපතිවරයා විසින් විශේෂයෙන් අවලංගු කරනු නොලැබුවේනම් නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට පටහැනිව යම් පානීය ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජලය බෙදා හැරීමේ දී ඒ පිළිබඳව හඳුනාගනු ලබන කවර අවස්ථාවක දී වුවද බලපත්‍රලාභියා වෙත අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා සභාපතිවරයා විසින් සාධාරණ කාලයක් ලබා දෙමින් ලිඛිත දැන්වීමක් භාරදිය යුතුය. එසේ ලබාදෙන සාධාරණ කාලය දින 14කට නොවැඩි විය යුතුය.

18. ඉහත වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව යටතේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීමට කිසියම් බලපත්‍රලාභියෙක් අපොහොසත්වන අවස්ථාවකදී සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරමින් ඒ බව බලපත්‍රය ලත් තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්ති යටතේ කුමක් සඳහන් කරනු ලැබුවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන බලපත්‍රයක් සඳහා අදාළ වන කිසියම් ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පළමු වරට බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන විටදී හා ලබාගත් බලපත්‍රයක් යටතේ වන ජල ව්‍යාපෘතියකට අදාළව වෙනස්කම් සහිතව නැවත බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයාට ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරනු ලබන කමිටුවකින් නිර්දේශ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් ඊට අදාළ බලපත්‍රය නිකුත් කිරීම නොකළ යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ 19 වගන්තියේ කාර්යය සඳහා හා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් පානීය ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත වන පරිදි කමිටුවක් විය යුතුය.

i. සභාපති

ii. ලේකම්

iii. තාක්ෂණික නිලධාරි

iv. පරිසර නිලධාරි

v. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ඔහු විසින් නම්කරන නිලධාරියෙකු

කෙසේ වුවද සේවයේ අවශ්‍යතාවය පරිදි කමිටුවේ පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා කමිටුවේ සහායට සභාවේ සභාපතිවරයා විසින් නම්කරනු ලබන වෙනත් කවර හෝ නිලධාරියෙකු කැඳවීමට ඉහත සඳහන් විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයකට යටත්ව, බලපත්‍රයකින් තොරව ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ දී හෝ 5 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දඩුවමකට යටත් විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වනවිට බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මකව පවතින මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පානීය ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසීන්ට අනුකූල වීම සඳහා කිසියම් ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙක්, ආයතනයක් හෝ සංවිධානයක් විසින් කිසියම් කාල සීමාවක් ඉල්ලා සිටින්නේනම් 20 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සභාපතිවරයා විසින් සහන කාලයක් ලබා දීම නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද මෙම වගන්තිය යටතේ ලබාදෙන සහන කාලය මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනෙන් පළමුවෙන් එළඹෙන ලිත් වර්ෂයක කාලය නොඉක්මවන කාලයක් නොවිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් පල්ලේපොල ප්‍රාදේශීය සභාව ද,
"සභාපතිවරයා" යන්නෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත අනුව පල්ලේපොල ප්‍රාදේශීය සභාව සඳහා පත්වන සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ධුරය ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී සභාපතිවරයාගේ ධුරයේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා ලිඛිත නීතියට අනුකූලව පත්වන ලබන අයෙකුද,
"අපද්‍රව්‍ය" යන්නෙන් වරින් වර සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ අපද්‍රව්‍ය සඳහා ලබා දී ඇති අර්ථයමද,
"බලය පවරන ලද නිලධාරි" යන්නෙන් සභාපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද,
"ජලමූලාශ්‍රයක්" යන්නෙන් පානීය ජල අවශ්‍යතාවයක් වෙනුවෙන් පොළව මතුපිට ජලය හෝ භූගත ජලය භාවිතයට ගැනීම සඳහා හේතුවන ස්වාභාවික හෝ කෘතිමව සිදුවන ජලය ඒකරාශී වීමක් හෝ පොදු පානීය ජල පරිහරණයක් සඳහා විභවතාවයක් ඇති ස්ථානයක් ද,

*උපලේඛන අංක 1*

**පානීය ජලය ලබා ගැනීම සඳහා ජලමූලාශ්‍ර භාවිතය බලපත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ නම
2. ලිපිනය
3. ඉල්ලුම්කරු ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි අංකය /ඉල්ලුම්කරු සමිතියක් වන්නේ නම් අදාළ සමිතියේ ලියාපදිංචි අංකය

4. ජල මූලාශ්‍රය පිහිටි ස්ථානය පිළිබඳ පහත සඳහන් තොරතුරු

   i. ජල මූලාශ්‍රයේ නම
   ii. පිහිටීම (දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   iii. ජල මූලාශ්‍රයේ ස්වභාවය
   iv. ග්‍රාම නිලධාරි වසම
   v. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
   vi. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
   vii. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   viii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලබන සේවකයන් පිළිබඳ තොරතුරු

| *අ/අ* | *නම* | *ලිපිනය* | *ජා.හැ.අ* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ව්‍යාපාරය සඳහා භාවිතා කරන වාහන සම්බන්ධ තොරතුරු

| අ/අ | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| | | |
| | | |

ඉහත අංක 05 සහ 06හි තොරතුරු වෙනස් වන සෑම අවස්ථාවකම සභාපතිවරයා දැනුවත් කළ යුතුය.

7. යෝජිත ජල ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව
8. දෛනිකව භාවිතා කිරීමට අපේක්ෂිත ජල ධාරිතාවය

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතුය.

i. සමිතියක් නම් ව්‍යවස්ථාවේ පිටපතක් සහ සමිතිය ලියාපදිංචි සහතිකයේ පිටපතක්
ii. ජල ව්‍යාපෘතියට අදාළ සංරචක උපයෝගී කර ගෙන ඇති ආකාරය පැහැදිළි වන පරිදි පිළිගත හැකි තාක්ෂණික නිලධාරියෙකු විසින් සහතික කරන ලද දල සැලැස්ම
iii. ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම
iv. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමීත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරීත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති ලේඛන

අයදුම්කරුගේ අත්සන

දිනය

(මෙම අයදුම්පත්‍රය සමග අදාළ මාර්ගෝපදේශ ඇතුළත් ලේඛනයේ පිටපතක් ලබා දෙනු ලැබේ)

*උපලේඛන අංක 2*

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම -
2. ලිපිනය -
3. ජා.හැ.අ. -
4. අවසර ලබා දෙනු ලැබූ ජල මූලාශ්‍රය -
5. අවසර දෙනු ලැබූ කාලය -

.....................................
සභාපති,
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

දිනයඃ

EOG 01 - 0093/3

## මධ්‍යම පළාතේ පළාත් සභාව

### අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (ix) හා (xiii) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ පානීය ජල සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) (අ) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම *ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 22 වැනි දින,
ආණ්ඩුකාර කාර්යාලය,
මාළිගා චතුරස්‍රය,
මහනුවර.

### පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස පෞද්ගලික භාවිතය හා පොදු භාවිතය තුළ පානීය ජල සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිණිස ඊට අදාළ ජල මූලාශ්‍ර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතිවලට අදාළ ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු පානීය ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) හා 126 (XIII) යන උපවගන්ති සමග කියවිය යුතු එම පනතේ 122 (1) උපවගන්තිය යටතේ පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවට බලතල පිරිනැමී ඇත.

3. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ පිහිටියාවූ මහජනතාවගේ පරිභෝජනය සඳහා පානීය ජලය සපයන සෑම ජල මූලාශ්‍රයකටම අදාළව පහත සඳහන් තොරතුරු පවත්වාගත යුතුය.

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම
iii. ග්‍රාම නිලධාරි වසම
iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
vii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල මූලාශ්‍රය භූගත ජල මූලාශ්‍රයක් වන විටදී ඉන් මීටර 15ක අරයකින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනීම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
iii. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.

iv. කැනීම් සිදු කිරීම
v. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ ඉදිකර ඇති කාණු පළුදු තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉඩ හැරීම.
vi. කවර හෝ දුරක සිට මූලාශ්‍රයට මතුපිට ජලය එකළුල්ලේ ගලා ඒමට සැළැස්වීම.
vii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විට දී ළිඳේ ගැට්ටේ සිට මීටර් 4.5ක අඩු දුරක සිට පොළොව මතුපිට ජලය ළිඳ තුළට කාන්දු වීමට ඉඩ හැරීම.
viii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, බිම් මට්ටමේ සිට මීටර් 3කට වඩා අඩු ගැඹුරකින් ළිඳට ජලය කාන්දු වන ආකාරයට පවත්වා ගැනීම.
ix. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ළිඳේ ආරක්ෂාව සඳහා සිමෙන්ති හා යකඩ යොදා වැර ගැන්වූ කොන්ක්‍රීට් හා ළිං ආවරණ යොදා ඇති අවස්ථාවක ඒ සඳහා භාවිතා කර ඇති සිමෙන්ති ජලයට මුසුවන පරිදි හෝ යකඩ ආශ්‍රිතව ගොඩනැගෙන මළ බැඳීම් ජලයට මුසුවන පරිදි පවතින ආකාරයෙන් තිබීමට ඉඩ හැරීම.
x. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි බලය පවරන ලද අයෙකු විසින් නියම කරන කාල සීමාවන් තුළ ළිං ජලය සම්පූර්ණයෙන්ම හිස්කර ළිඳ මනා පවිත්‍රතාවයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම.

6. ස්වාභාවික මතුපිට ජල මූලාශ්‍රයක් වන විටදී තුළුමුවේ සිට දෙපසට හා ඉහළට මීටර 30කින් හා පහළට මීටර් 10කින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනීම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. වාහන සේදීම හෝ වෙනත් කවර හෝ යන්ත්‍රෝපකරණ සේදීම.
iii. ස්නානය සඳහා භාවිතය.
iv. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
v. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.
vi. කැනීම් සිදු කිරීම
vii. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම.
viii. වන වගාවක් නොවන වෙනත් කිසිදු වගා කාර්යයක් සඳහා යොදා ගැනීම.
ix. කවර හෝ තැනැත්තෙකු විසින් ජල මූලාශ්‍රයට කිසියම් අපද්‍රව්‍යයක් මිශ්‍ර විය හැකි පරිදි ජලය පිටතට ගැනීම සඳහා වන බාල්දියක් හෝ වෙනත් කවර හෝ මෙවලමක් භාවිතයට ගැනීම.

7. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් හා ගෘහස්ථ භාවිතයක් සඳහා වන ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හැර, ජල මූලාශ්‍රයක් භාවිතා කරමින් පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් හෝ ආයතනයක් විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ දෙවෙනි උපලේඛනයට සාරාණුකූල වූ බලපත්‍රයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් ලබාගත යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව සාදන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලීම් කළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

10. 1 ජලය බෙදාහැරීම ජල නළ පද්ධතියක් පමණක් භාවිතා කරමින් පරිභෝජනය සඳහා ජලය බෙදාහරින අවස්ථාවකදී

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) ඉල්ලුම්කරනු ලබන්නා ප්‍රජා මූල සංවිධානයක් වන විටදී ප්‍රාදේශීය සභාවේ හෝ ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක හා ඉදිකිරීම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

(5) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරිත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(6) ජල ව්‍යාපෘතිය යටතේ සේවයේ යෙදවීමට අපේක්ෂිත සේවකයින් සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රය යටතේ ඉල්ලා සිටින තොරතුරු හා සේවකයින් වෙනස් වන සෑම අවස්ථාවකදීම ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරන බවට සහතික විය යුතුය.

10. 2 ජලය බෙදාහැරීම් බවුසරයක් හෝ ජල බහාලුමක් හෝ කවර හෝ මෙවලමක් භාවිතයට ගනිමින් ජලය එක්රැස්කර වාණිජ පරමාර්ථයන් වෙනුවෙන් ජලය බෙදාහැරීමක් සිදුකරන විටකදී,

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පවත්වාගෙන යන ජල මූලාශ්‍රයක් යටතේ ලබාගනු ලබන ජලය බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(3) භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය සම්බන්ධයෙන් හා බෙදා හරින ජලය සම්බන්ධයෙන් 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුව අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට එම මණ්ඩලය වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) භාවිතය සඳහා ලබාදෙන ජලය, ජල සම්පත් මණ්ඩලය විසින් නිර්දේශිත කවර හෝ ක්‍රමවේදයක් යටතේ ජලය පිරිපහදු කර තිබීම.

(5) ජලය බෙදා හැරීම සඳහා යම් වාහනයක්, බහාලුමක් හෝ වෙනත් යම් මෙවලමක් භාවිතයට ගන්නේනම් එසේ යොදාගනු ලබන භාවිතය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීම් කරනු ලබන අවස්ථාවකදී එසේ ඉල්ලුම් පත්‍රය ලැබී මාසයක් ඇතුළත අපේක්ෂිත බලපත්‍රය ලබා දීම හෝ එසේ ලබාදිය නොහැකිනම් ඒ සඳහා වන හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසුව වලංගු වන්නේය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

i. බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

ii. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

iii. බලපත්‍රය ඉල්ලුම් කිරීමේ දී තහවුරු කරන ලද ජල මූලාශ්‍රය වෙතින් ලබා ගන්නා ලද ජලය බලපත්‍රයට අදාළ වන කාර්යයන් සඳහා යොදාගනු ලබන බවට තහවුරු වන පරිදි ක්‍රියා කළ යුතුය.

iv. ජලය බෙදාහැරීමේ දී ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා වෙනත් මෙවලම් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් නිකුත් කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුකූලව නිපදවා තිබිය යුතුය.

v. භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය හා බෙදා හරින ජලය 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.

vi. යොදාගනු ලබන සෑම සේවකයෙක්ම චර්මගත රෝගයකින් හෝ බෝවන රෝගයකින් පෙළෙන අයෙකු හෝ එවැනි අයෙකු ඇසුරු කළ අයෙකු නොවිය යුතුය.

vii. සේවයේ යොදවන සෑම අවස්ථාවකදීම සෞඛ්‍ය ආරක්ෂිත හා පිරිසිදු තත්වයේ ඇඳුම් ඇඳ සිටිය යුතු අතර, නියමිත පරිදි අත්වැසුම් පැළඳ සිටිය යුතුය.

viii. බල ප්‍රදේශය තුළ රෝග වැළැක්වීම හා නිරෝධායන ආඥාපනතට අනුකූලව නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවක දී එම නියෝගයන් යටතේ දක්වා ඇති කොන්දේසීන්ට අනුකූලව සේවාවන් පවත්වාගත යුතුය.

ix. ජල ව්‍යාපෘතියට අදාළව සේවයේ යොදවනු ලබන සෑම සේවකයෙකුම බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන තොරතුරුවලට නම් ඇතුළත් කරන ලද හෝ ඉන් පසු කවර හෝ අවස්ථාවක සේවයට යොදාගනු ලැබීනම් ඒ පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරුවලට නම් ඇතුළත් කරන ලද අයෙකු විය යුතුය.

x. ජල ව්‍යාපෘතිය යටතේ සේවය කරනු ලබන සේවකයන් පිළිබඳව සෑම මාස හයකටම වරක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිර්දේශ කරන කාල සීමාවන් යටතේ සේවකයින් අදාළ සේවයේ යෙදවීම යථා යෝග්‍ය බවට තහවුරු කරන සහතිකයක් මගින් සනාථ කර තිබිය යුතුය.

14. බල ප්‍රදේශය තුළ වූ කිසියම් ජල මූලාශ්‍රයක් ජාතික ජල සම්පාදන මණ්ඩලය හැර මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයක් යටතේ භාවිතයට ගනු ලබන අවස්ථාවක දී එම බලපත්‍රය ලත් තැනැත්තා හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් එම ජල මූලාශ්‍රය භාවිතයට ගැනීමක් හෝ ඊට අයුතු ජල සම්බන්ධතාවයක් පවත්වා ගැනීම නොකළ යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ වන කවර හෝ ජල මූලාශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට අනුකූලව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සුදුසු හා සාධාරණයැයි සැළකිය හැකි වේලාවකදී සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය පවරන ලද කවර හෝ සභාවේ නිලධාරියෙකු ජල මූලාශ්‍රය පිහිටි පරිශ්‍රයට ඇතුල් වීම, සාම්පල් ලබා ගැනීම හෝ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි හැඟෙන වෙනත් තොරතුරක් ඉල්ලා සිටීම, පානීය ජලය බෙදාහරින යම් අවස්ථාවක එසේ බෙදාහරින ජලය සම්බන්ධයෙන් හෝ ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා මෙවලම් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකිරීම, ඒ සඳහා අවශ්‍යයැයි හැඟෙන තොරතුරක් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කාලය සභාපතිවරයා විසින් විශේෂයෙන් අවලංගු කරනු නොලැබුවේනම් නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට පටහැනිව යම් පානීය ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජලය බෙදා හැරීමේ දී ඒ පිළිබඳව හඳුනාගනු ලබන කවර අවස්ථාවක දී වුවද බලපත්‍රලාභියා වෙත අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා සභාපතිවරයා විසින් සාධාරණ කාලයක් ලබා දෙමින් ලිඛිත දැන්වීමක් භාරදිය යුතුය. එසේ ලබාදෙන සාධාරණ කාලය දින 14කට නොවැඩි විය යුතුය.

18. ඉහත වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව යටතේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීමට කිසියම් බලපත්‍රලාභියෙක් අපොහොසත්වන අවස්ථාවකදී සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරමින් ඒ බව බලපත්‍රය ලත් තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්ති යටතේ කුමක් සඳහන් කරනු ලැබුවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන බලපත්‍රයක් සඳහා අදාළ වන කිසියම් ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පළමු වරට බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන විටදී හා ලබාගත් බලපත්‍රයක් යටතේ වන ජල ව්‍යාපෘතියකට අදාළව වෙනස්කම් සහිතව නැවත බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයාට ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරනු ලබන කමිටුවකින් නිර්දේශ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් ඊට අදාළ බලපත්‍රය නිකුත් කිරීම නොකළ යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ 19 වගන්තියේ කාර්යය සඳහා හා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් පානීය ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත වන පරිදි කමිටුවක් විය යුතුය.

i. සභාපති
ii. ලේකම්
iii. තාක්ෂණික නිලධාරි
iv. පරිසර නිලධාරි
v. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ඔහු විසින් නම්කරන නිලධාරියෙකු

කෙසේ වුවද සේවයේ අවශ්‍යතාවය පරිදි කමිටුවේ පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා කමිටුවේ සහායට සභාවේ සභාපතිවරයා විසින් නම්කරනු ලබන වෙනත් කවර හෝ නිලධාරියෙකු කැඳවීමට ඉහත සඳහන් විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයකට යටත්ව, බලපත්‍රයකින් තොරව ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ දී හෝ 5 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දඬුවමකට යටත් විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වනවිට බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මකව පවතින මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පානීය ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසීන්ට අනුකූල වීම සඳහා කිසියම් ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙක්, ආයතනයක් හෝ සංවිධානයක් විසින් කිසියම් කාල සීමාවක් ඉල්ලා සිටින්නේනම් 20 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සභාපතිවරයා විසින් සහන කාලයක් ලබා දීම නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද මෙම වගන්තිය යටතේ ලබාදෙන සහන කාලය මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනෙන් පළමුවෙන් එළඹෙන ලිත් වර්ෂයක කාලය නොඉක්මවන කාලයක් නොවිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව ද,
"සභාපතිවරයා" යන්නෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත අනුව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව සඳහා පත්වන සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ධුරය ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී සභාපතිවරයාගේ ධුරයේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා ලිඛිත නීතියට අනුකූලව පත්වන ලබන අයෙකුද,
"අපද්‍රව්‍ය" යන්නෙන් වරින් වර සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ අපද්‍රව්‍ය සඳහා ලබා දී ඇති අර්ථයමද,
"බලය පවරන ලද නිලධාරි" යන්නෙන් සභාපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද,
"ජලමූලාශ්‍රයක්" යන්නෙන් පානීය ජල අවශ්‍යතාවයක් වෙනුවෙන් පොළව මතුපිට ජලය හෝ භූගත ජලය භාවිතයට ගැනීම සඳහා හේතුවන ස්වාභාවික හෝ කෘතිමව සිදුවන ජලය ඒකරාශී වීමක් හෝ පොදු පානීය ජල පරිහරණයක් සඳහා විභවතාවයක් ඇති ස්ථානයක් ද,

*උපලේඛන අංක 1*

**පානීය ජලය ලබා ගැනීම සඳහා ජලමූලාශ්‍ර භාවිතය බලපත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ නම
2. ලිපිනය
3. ඉල්ලුම්කරු ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි අංකය /ඉල්ලුම්කරු සමිතියක් වන්නේ නම් අදාළ සමිතියේ ලියාපදිංචි අංකය

4. ජල මූලාශ්‍රය පිහිටි ස්ථානය පිළිබඳ පහත සඳහන් තොරතුරු

   i. ජල මූලාශ්‍රයේ නම
   ii. පිහිටීම (දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   iii. ජල මූලාශ්‍රයේ ස්වභාවය
   iv. ග්‍රාම නිලධාරි වසම
   v. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
   vi. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
   vii. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   viii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලබන සේවකයන් පිළිබඳ තොරතුරු

| *අ/අ* | *නම* | *ලිපිනය* | *ජා.හැ.අ* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ව්‍යාපාරය සඳහා භාවිතා කරන වාහන සම්බන්ධ තොරතුරු

| *අ/අ* | *වාහන අංකය* | *වාහන වර්ගය* |
|---|---|---|
| | | |
| | | |

ඉහත අංක 05 සහ 06හි තොරතුරු වෙනස් වන සෑම අවස්ථාවකම සභාපතිවරයා දැනුවත් කළ යුතුය.

7. යෝජිත ජල ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව
8. දෛනිකව භාවිතා කිරීමට අපේක්ෂිත ජල ධාරිතාවය

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතුය.

i. සමිතියක් නම් ව්‍යවස්ථාවේ පිටපතක් සහ සමිතිය ලියාපදිංචි සහතිකයේ පිටපතක්
ii. ජල ව්‍යාපෘතියට අදාළ සංරචක උපයෝගී කර ගෙන ඇති ආකාරය පැහැදිළි වන පරිදි පිළිගත හැකි තාක්ෂණික නිලධාරියෙකු විසින් සහතික කරන ලද දළ සැලැස්ම
iii. ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම
iv. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරීත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති ලේඛන.

අයදුම්කරුගේ අත්සන

දිනය

(මෙම අයදුම්පත්‍රය සමග අදාළ මාර්ගෝපදේශ ඇතුළත් ලේඛනයේ පිටපතක් ලබා දෙනු ලැබේ)

*උපලේඛන අංක 2*

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම -
2. ලිපිනය -
3. ජා.හැ.අ. -
4. අවසර ලබා දෙනු ලැබූ ජල මූලාශ්‍රය -
5. අවසර දෙනු ලැබූ කාලය -

.....................................
සභාපති,
ප්‍රාදේශීය සභාව.

දිනයඃ

EOG 01 - 0093/4

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

255 වන අධිකාරිය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 157 (12) (උ) උප වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ගම්පොල නගර සභාවේ පානීය ජල සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) (අ) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 157 (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම *ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව ගම්පොල නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 22 වැනි දින,
ආණ්ඩුකාර කාර්යාලය,
මාළිගා චතුරස්‍රය,
මහනුවර දී ය.

**ගම්පොල නගර සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. ගම්පොල නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස පෞද්ගලික භාවිතය හා පොදු භාවිතය තුළ පානීය ජල සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිණිස ඊට අදාළ ජල මූලාශ්‍ර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතිවලට අදාළ ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු පානීය ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට (255 වන අධිකාරය) 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 157 (12) (උ) යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 153 උප වගන්තිය යටතේ ගම්පොල නගර සභාවට බලතල පිරිනැමී ඇත.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ගම්පොල නගර සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. ගම්පොල නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ පිහිටියා වූ මහජනතාවගේ පරිභෝජනය සඳහා පානීය ජලය සපයන සෑම ජල මූලාශ්‍රයකටම අදාළව පහත සඳහන් තොරතුරු පවත්වාගත යුතුය.

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම
iii. ග්‍රාම නිලධාරි වසම
iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
vii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල මූලාශ්‍රය භූගත ජල මූලාශ්‍රයක් වන විටදී ඉන් මීටර 15ක අරයකින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනිම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
iii. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ග ගැනීම.

iv. කැනීම් සිදු කිරීම
v. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ ඉදිකර ඇති කාණු පළුදු තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉඩ හැරීම.
vi. කවර හෝ දුරක සිට මූලාශ්‍රයට මතුපිට ජලය එකඑල්ලේ ගලා ඒමට සැළැස්වීම.
vii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විට දී ළිඳේ ගැට්ටේ සිට මීටර් 4.5ක අඩු දුරක සිට පොළොව මතුපිට ජලය ළිඳ තුළට කාන්දු වීමට ඉඩ හැරීම.
viii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, බිම් මට්ටමේ සිට මීටර් 3කට වඩා අඩු ගැඹුරකින් ළිඳට ජලය කාන්දු වන ආකාරයට පවත්වා ගැනීම.
ix. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ළිඳේ ආරක්ෂාව සඳහා සිමෙන්ති හා යකඩ යොදා වැර ගැන්වූ කොන්ක්‍රීට් හා ළිං ආවරණ යොදා ඇති අවස්ථාවක ඒ සඳහා භාවිතා කර ඇති සිමෙන්ති ජලයට මුසුවන පරිදි හෝ යකඩ ආශ්‍රිතව ගොඩනැගෙන මළ බැඳීම් ජලයට මුසුවන පරිදි පවතින ආකාරයෙන් තිබීමට ඉඩ හැරීම.
x. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, නගර සභාවේ සභාපතිවරයා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි බලය පවරන ලද අයෙකු විසින් නියම කරන කාල සීමාවන් තුළ ළිං ජලය සම්පූර්ණයෙන්ම හිස්කර ළිඳ මනා පවිත්‍රතාවයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම.

6. ස්වාභාවික මතුපිට ජල මූලාශ්‍රයක් වන විටදී තුළුමුවේ සිට දෙපසට හා ඉහළට මීටර 30කින් හා පහළට මීටර් 10කින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනිම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැලසෙන ආකාරයට පවත්වාගෙන යාම.
ii. වාහන සේදීම හෝ වෙනත් කවර හෝ යන්ත්‍රෝපකරණ සේදීම.
iii. ස්නානය සඳහා භාවිතය.
iv. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
v. විවෘත අවකාශය තුළ ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.
vi. කැනීම් සිදු කිරීම
vii. කිසියම් කාණුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම.
viii. වන වගාවක් නොවන වෙනත් කිසිදු වගා කාර්යයක් සඳහා යොදා ගැනීම.
ix. කවර හෝ තැනැත්තෙකු විසින් ජල මූලාශ්‍රයට කිසියම් අපද්‍රව්‍යයක් මිශ්‍ර විය හැකි පරිදි ජලය පිටතට ගැනීම සඳහා වන බාල්දියක් හෝ වෙනත් කවර හෝ මෙවලමක් භාවිතයට ගැනීම.

7. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් හා ගෘහස්ථ භාවිතයක් සඳහා වන ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හැර, ජල මූලාශ්‍රයක් භාවිතා කරමින් පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් හෝ ආයතනයක් විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ දෙවෙනි උපලේඛනයට සාරාණුකූල වූ බලපත්‍රයක් නගර සභාවේ සභාපතිවරයා වෙතින් ලබාගත යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව සාදන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලීම් කළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

10. 1 ජලය බෙදාහැරීම ජල නළ පද්ධතියක් පමණක් භාවිතා කරමින් පරිභෝජනය සඳහා ජලය බෙදාහරින අවස්ථාවකදී

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) ඉල්ලුම්කරනු ලබන්නා ප්‍රජා මූල සංවිධානයක් වන විටදී නගර සභාවේ හෝ ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක හා ඉදිකිරීම් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

(5) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරිත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(6) ජල ව්‍යාපෘතිය යටතේ සේවයේ යෙදවීමට අපේක්ෂිත සේවකයින් සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රය යටතේ ඉල්ලා සිටින තොරතුරු හා සේවකයින් වෙනස් වන සෑම අවස්ථාවකදීම ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරන බවට සහතික විය යුතුය.

10. 2 ජලය බෙදාහැරීම් බවුසරයක් හෝ ජල බහාලුමක් හෝ කවර හෝ මෙවලමක් භාවිතයට ගනිමින් ජලය එක්රැස්කර වාණිජ පරමාර්ථයන් වෙනුවෙන් ජලය බෙදාහැරීමක් සිදුකරන විටකදී,

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පවත්වාගෙන යන ජල මූලාශ්‍රයක් යටතේ ලබාගනු ලබන ජලය බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(3) භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය සම්බන්ධයෙන් හා බෙදා හරින ජලය සම්බන්ධයෙන් 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුව අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට එම මණ්ඩලය වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) භාවිතය සඳහා ලබාදෙන ජලය, ජල සම්පත් මණ්ඩලය විසින් නිර්දේශිත කවර හෝ ක්‍රමවේදයක් යටතේ ජලය පිරිපහදු කර තිබීම.

(5) ජලය බෙදා හැරීම සඳහා යම් වාහනයක්, බහාලුමක් හෝ වෙනත් යම් මෙවලමක් භාවිතයට ගන්නේනම් එසේ යොදාගනු ලබන භාවිතය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීම් කරනු ලබන අවස්ථාවකදී එසේ ඉල්ලුම් පත්‍රය ලැබී මාසයක් ඇතුළත අපේක්ෂිත බලපත්‍රය ලබා දීම හෝ එසේ ලබාදිය නොහැකිනම් ඒ සඳහා වන හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව ගම්පොල නගර සභාව විසින් තීරණය කර *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසුව වලංගු වන්නේය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

i. බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

ii. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියලු සංරචක ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

iii. බලපත්‍රය ඉල්ලුම් කිරීමේ දී තහවුරු කරන ලද ජල මූලාශ්‍රය වෙතින් ලබා ගන්නා ලද ජලය බලපත්‍රයට අදාළ වන කාර්යයන් සඳහා යොදාගනු ලබන බවට තහවුරු වන පරිදි ක්‍රියා කළ යුතුය.

iv. ජලය බෙදාහැරීමේ දී ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා වෙනත් මෙවලම් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් නිකුත් කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුකූලව නිපදවා තිබිය යුතුය.

v. භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය හා බෙදා හරින ජලය 1964 අංක 24 දරන ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.

vi. යොදාගනු ලබන සෑම සේවකයෙක්ම චර්මගත රෝගයකින් හෝ බෝවන රෝගයකින් පෙළෙන අයෙකු හෝ එවැනි අයෙකු ඇසුරු කළ අයෙකු නොවිය යුතුය.

vii. සේවයේ යොදවන සෑම අවස්ථාවකදීම සෞඛ්‍ය ආරක්ෂිත හා පිරිසිදු තත්ත්වයේ ඇඳුම් ඇඳ සිටිය යුතු අතර, නියමිත පරිදි අත්වැසුම් පැළඳ සිටිය යුතුය.

viii. බල ප්‍රදේශය තුළ රෝග වැළැක්වීම හා නිරෝධායන ආඥා පනතට අනුකූලව නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවක දී එම නියෝගයන් යටතේ දක්වා ඇති කොන්දේසීන්ට අනුකූලව සේවාවන් පවත්වාගත යුතුය.

ix. ජල ව්‍යාපෘතියට අදාළව සේවයේ යොදවනු ලබන සෑම සේවකයෙකුම බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන තොරතුරු වලට නම් ඇතුළත් කරන ලද හෝ ඉන් පසු කවර හෝ අවස්ථාවක සේවයට යොදාගනු ලැබීනම් ඒ පිළිබඳ තොරතුරු නගර සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරුවලට නම් ඇතුළත් කරන ලද අයෙකු විය යුතුය.

x. ජල ව්‍යාපෘතිය යටතේ සේවය කරනු ලබන සේවකයන් පිළිබඳව සෑම මාස හයකටම වරක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිර්දේශ කරන කාල සීමාවන් යටතේ සේවකයින් අදාළ සේවයේ යෙදවීම යථා යෝග්‍ය බවට තහවුරු කරන සහතිකයක් මගින් සනාථ කර තිබිය යුතුය.

14. බල ප්‍රදේශය තුළ වූ කිසියම් ජල මූලාශ්‍රයක් ජාතික ජල සම්පාදන මණ්ඩලය හැර මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයක් යටතේ භාවිතයට ගනු ලබන අවස්ථාවක දී එම බලපත්‍රය ලත් තැනැත්තා හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් එම ජල මූලාශ්‍රය භාවිතයට ගැනීමක් හෝ ඊට අයුතු ජල සම්බන්ධතාවයක් පවත්වා ගැනීම නොකළ යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ වන කවර හෝ ජල මූලාශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට අනුකූලව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සුදුසු හා සාධාරණයැයි සැළකිය හැකි වේලාවකදී සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය පවරන ලද කවර හෝ සභාවේ නිලධාරියෙකු ජල මූලාශ්‍රය පිහිටි පරිශ්‍රයට ඇතුල් වීම, සාම්පල් ලබා ගැනීම හෝ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි හැඟෙන වෙනත් තොරතුරක් ඉල්ලා සිටීම, පානීය ජලය බෙදාහරින යම් අවස්ථාවක එසේ බෙදාහරින ජලය සම්බන්ධයෙන් හෝ ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා මෙවලම් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකිරීම, ඒ සඳහා අවශ්‍යයැයි හැඟෙන තොරතුරක් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කාලය සභාපතිවරයා විසින් විශේෂයෙන් අවලංගු කරනු නොලැබුවේනම් නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට පටහැනිව යම් පානීය ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජලය බෙදා හැරීමේ දී ඒ පිළිබඳව හඳුනාගනු ලබන කවර අවස්ථාවක දී වුවද බලපත්‍රලාභියා වෙත අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා සභාපතිවරයා විසින් සාධාරණ කාලයක් ලබා දෙමින් ලිඛිත දැන්වීමක් භාරදිය යුතුය. එසේ ලබාදෙන සාධාරණ කාලය දින 14කට නොවැඩි විය යුතුය.

18. ඉහත වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව යටතේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීමට කිසියම් බලපත්‍රලාභියෙක් අපොහොසත්වන අවස්ථාවකදී සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරමින් ඒ බව බලපත්‍රය ලත් තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්ති යටතේ කුමක් සඳහන් කරනු ලැබුවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන බලපත්‍රයක් සඳහා අදාළ වන කිසියම් ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පළමු වරට බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන විටදී හා ලබාගත් බලපත්‍රයක් යටතේ වන ජල ව්‍යාපෘතියකට අදාළව වෙනස්කම් සහිතව නැවත බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයාට ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරනු ලබන කමිටුවකින් නිර්දේශ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් ඊට අදාළ බලපත්‍රය නිකුත් කිරීම නොකළ යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ 19 වගන්තියේ කාර්යය සඳහා හා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් පානීය ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත වන පරිදි කමිටුවක් විය යුතුය.

i. සභාපති
ii. ලේකම්
iii. තාක්ෂණික නිලධාරි
iv. පරිසර නිලධාරි
v. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ඔහු විසින් නම්කරන නිලධාරියෙකු

කෙසේ වුවද සේවයේ අවශ්‍යතාවය පරිදි කමිටුවේ පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා කමිටුවේ සහායට සභාවේ සභාපතිවරයා විසින් නම්කරනු ලබන වෙනත් කවර හෝ නිලධාරියෙකු කැඳවීමට ඉහත සඳහන් විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයකට යටත්ව, බලපත්‍රයකින් තොරව ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ දී හෝ 5 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු නගර සභා ආඥාපනතේ 153 (2) වගන්තිය යටතේ සඳහන් දඬුවමකට යටත් විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වනවිට බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මකව පවතින මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පානීය ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසීන්ට අනුකූල වීම සඳහා කිසියම් ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙක්, ආයතනයක් හෝ සංවිධානයක් විසින් කිසියම් කාල සීමාවක් ඉල්ලා සිටින්නේනම් 20 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සභාපතිවරයා විසින් සහන කාලයක් ලබා දීම නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද මෙම වගන්තිය යටතේ ලබාදෙන සහන කාලය මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනෙන් පළමුවෙන් එළඹෙන ලිත් වර්ෂයක කාලය නොඉක්මවන කාලයක් නොවිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

"නගර සභා ආඥාව" යන්නෙන් ගම්පොල නගර සභාව ද,
"සභාපතිවරයා" යන්නෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත අනුව ගම්පොල නගර සභාව සඳහා පත්වන සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ධුරය ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී සභාපතිවරයාගේ ධුරයේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා ලිඛිත නීතියට අනුකූලව පත්වන ලබන අයෙකුද,
"අපද්‍රව්‍ය" යන්නෙන් වරින් වර සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ අපද්‍රව්‍ය සඳහා ලබා දී ඇති අර්ථයමද,
"බලය පවරන ලද නිලධාරි" යන්නෙන් සභාපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද,
"ජලමූලාශ්‍රයක්" යන්නෙන් පානීය ජල අවශ්‍යතාවයක් වෙනුවෙන් පොළව මතුපිට ජලය හෝ භූගත ජලය භාවිතයට ගැනීම සඳහා හේතුවන ස්වාභාවික හෝ කෘතිමව සිදුවන ජලය ඒකරාශී වීමක් හෝ පොදු පානීය ජල පරිහරණයක් සඳහා විභවතාවයක් ඇති ස්ථානයක් ද,

*උපලේඛන අංක 1*

**පානීය ජලය ලබා ගැනීම සඳහා ජලමූලාශ්‍ර භාවිතය බලපත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ නම
2. ලිපිනය
3. ඉල්ලුම්කරු ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි අංකය /ඉල්ලුම්කරු සමිතියක් වන්නේ නම් අදාළ සමිතියේ ලියාපදිංචි අංකය

4. ජල මූලාශ්‍රය පිහිටි ස්ථානය පිළිබඳ පහත සඳහන් තොරතුරු
   i. ජල මූලාශ්‍රයේ නම
   ii. පිහිටීම (දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   iii. ජල මූලාශ්‍රයේ ස්වභාවය
   iv. ග්‍රාම නිලධාරි වසම
   v. ස්ථානය පිහිටීමේ බණ්ඩාංක
   vi. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
   vii. ප්‍රවේශය (හැකිතාක් දළ සැලැස්මකින් නිරූපනය කළ යුතුය)
   viii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලබන සේවකයන් පිළිබඳ තොරතුරු

| *අ/අ* | *නම* | *ලිපිනය* | *ජා.හැ.අ.* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ව්‍යාපාරය සඳහා භාවිතා කරන වාහන සම්බන්ධ තොරතුරු

| *අ/අ* | *වාහන අංකය* | *වාහන වර්ගය* |
|---|---|---|
| | | |
| | | |

ඉහත අංක 05 සහ 06හි තොරතුරු වෙනස් වන සෑම අවස්ථාවකම සභාපතිවරයා දැනුවත් කළ යුතුය.

7. යෝජිත ජල ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව
8. දෛනිකව භාවිතා කිරීමට අපේක්ෂිත ජල ධාරිතාවය

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතුය.

i. සමිතියක් නම් ව්‍යවස්ථාවේ පිටපතක් සහ සමිතිය ලියාපදිංචි සහතිකයේ පිටපතක්
ii. ජල ව්‍යාපෘතියට අදාළ සංරචක උපයෝගී කර ගෙන ඇති ආකාරය පැහැදිළි වන පරිදි පිළිගත හැකි තාක්ෂණික නිලධාරියෙකු විසින් සහතික කරන ලද දළ සැලැස්ම
iii. ජල යෝජනා ක්‍රමයට අදාළ වන සියලු සංරචක ඇතුළත් සැලැස්ම
iv. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නළ පද්ධතිය පෞද්ගලික දේපළක් මතින් යෙදවීමේ දී ඊට අදාළ ස්වාමීත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපළක් මතින් යෙදවෙන විටදී ඊට අදාළ අධිකාරිත්වය විසින් ඊට අදාළ අවසරය ලබා දී ඇති ලේඛන.

අයදුම්කරුගේ අත්සන

දිනය

(මෙම අයදුම්පත්‍රය සමග අදාළ මාර්ගෝපදේශ ඇතුළත් ලේඛනයේ පිටපතක් ලබා දෙනු ලැබේ)

### *උපලේඛන අංක 2*

නගර සභා බල ප්‍රදේශය තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම -
2. ලිපිනය -
3. ජා.හැ.අ. -
4. අවසර ලබා දෙනු ලැබූ ජල මූලාශ්‍රය -
5. අවසර දෙනු ලැබූ කාලය -

.....................................
සභාපති,
නගර සභාව.

දිනයः

EOG 01 - 0093/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.